අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

මගේ අංකය / எனது இல. / My No. PMO/SEC/01/09

ඔබේ යොමුව / உமது குறிப்பு / Your Ref.

දිනය / திகதி / Date 2023.05.25

ඉකා වැදගත්

එම් එස් රණසිංහ මහතා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

හිතවත් ලේකම්තුමනි,

ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අධ්‍යයන හා අනධ්‍යයන මානව සම්පත් අවශ්‍යතා ආශ්‍රිත තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම

උක්ත තරුණට අදාළව ඔබ වෙත එවා ඇති මගේ සමාංක හා 2023.04.26 හා 2023.05.10 දිනැති ලිපි කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු රිසියෙමි. (ඔබ පහසු පරිශීලනය සඳහා අදාළ ලිපිවල පිටපත් ඇමුණුම් කර ඇත.)

එම ලිපි මගින් ඔබ වෙත දැනුම් දී ඇති පරිදි, ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සහතිකවනු පිණිස 2023.06.01 දිනට මෙරට ජාතික විශ්වවිද්‍යාල පද්ධතියෙන් විශ්‍රාම යාමට නියමිත අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් හා මෙම වර්ෂය තුළ යම් හෙයකින් ඉල්ලා අස්වීම, විධිමත් පරිදි රාජකාරි නිවාඩු අනුමත කර නොගෙන විදේශ ගතවීම් ආදී හේතූන් මත තනතුරු අතහැර යාම වැනි කරුණු පාදක කොට අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු ඇති වී ඇත්නම් එම සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් 2023 වර්ෂය සඳහා දැනටමත් වෙන්කර ඇති අයවැය ප්‍රතිපාදන සීමාව ඇතුළත කළමනාකරණය කර ගැනීමට යටත්ව එක් එක් තනතුරට අදාළ බඳවා ගැනීම් පටිපාටීන්ට අනුකූලව සුදුසුකම් මත විධිමත් පරිදි බඳවා ගැනීමට කමිටු එකඟතාවය ලබා දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ඒ සඳහා දැනටමත් ලැබී ඇත.

එහෙත්, දිවයින පුරා පිහිටි ජාතික විශ්වවිද්‍යාල විසින් තම විශ්වවිද්‍යාලවල තනතුරු පුරප්පාඩු සඳහා අනුමැතිය අපේක්ෂාවෙන්, කමිටුව වෙත අයදුම් කිරීමේ නියමිත ක්‍රමවේදය මුළුමනින්ම මඟහරිමින් ඉල්ලීම් විශාල වශයෙන් මෙම කාර්යාලය වෙත යොමු වන තත්ත්වයක් නිරීක්ෂණය කරමි.

එබැවින්, ඉහත තීරණය කඩිනමින්ම විශ්වවිද්‍යාල පද්ධතිය වෙත සම්ප්‍රේෂණය කරන මෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම වෙත උපදෙස් ලබා දෙන මෙන් කාරුණිකව දන්වමි.

මෙයට-විශ්වාසී,

අනුර දිසානායක
අග්‍රාමාත්‍ය ලේකම්
සභාපති, රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද නිලධාරී කමිටුව

දුරකථන අංකය : +94 11- 2575311 ෆැක්ස් අංකය : +94 11- 2575310
විද්‍යුත් ලිපිනය : secpm@pmoffice.gov.lk

කාර්යාලය / அலுவலகம் / Gen. Office 2575317, 2575318
ෆැක්ස් / பெக்ஸ் / Fax 2574143, 2575454, 2575310
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail secpm@pmoffice.gov.lk

පිටපත් :-

1. ජනාධිපති ලේකම්
2. විගණකාධිපති
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
5. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

} කරු.දැ.ගැ.ස

6. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - කරු. අවධානයට

7. සියලුම රජයේ විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන්
8. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
9. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
10. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
11. ලේකම්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

} කරු.දැ.ගැ.ස

සැ.යු : නව රාජ්‍ය විගණන කළමනාකරණ ක්‍රමවේදවලට අනුකූලව මෙම ලිපිය විද්‍යුත් ප්‍රවේශ මඟින් සමණක් ඔබ වෙත සම්ප්‍රේෂණය වන බැවින්, කාර්යාලීය කටයුතු හා ගොනුගත කිරීම් සඳහා අවශ්‍යවන්නේ නම් මුද්‍රිත පිටපතක් ලබා ගැනීම මැනවි.